**අඹගමුව ප්‍රාදේශීය සභාව - 2021**
**----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**------------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය
**----------------------------------**

අඹගමුව ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට අඹගමුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
**-----------------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්
**----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (I) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාළ රු.35,090 ක වැටුප් වියදම් වසරේ වියදමක් ලෙසට නොදක්වා සමුච්චිත අරමුදලට ගලපා තිබුණි. | නිවැරදි කරන බව දන්වා ඇත. | ගනුදෙනු නිවැරදි ලෙස වාර්ෂික මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගත යුතුය. |
| (ආ) | සභාව පවත්වාගෙන ගොස් තිබුණු ඉඩම් හා ගොඩනැගිලි ලේඛනයේ ඇතුළත් සභාව විසින් භුක්ති විඳින ,ප්‍රයෝජනයට ගන්නා ඉඩම් කට්ටි 42 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | අදාළ ඉඩම් සම්බන්ධයෙන් තාවකාලික තක්සේරුවක් තාක්ෂණික නිළධාරි හා ආදායම් පරීක්ෂක මඟින් ලබා ගැනීමට කටයුතු කරමින් පවතින බව දන්වා ඇත. | සියළු වත්කම් ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශනවල අවස්ථා 03 කදී එකතුව රු.1,362,800 ක වත්කම් වැඩියෙන් දැක්වීම්ද, එක් අවස්ථාවකදී එකතුව රු.129,250 ක වත්කම් අඩුවෙන් දැක්වීම්ද, පැවතුණි. | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලින් නිවැරදි කරන බව දන්වා ඇත. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ගිණුම් ශේෂ 03 කට අදාළ උපලේඛන සමඟ පරීක්ෂා කිරීමේදී රු.419,221 ක වෙනස්කම් පැවතුණි . | පරීක්ෂා කර බලා ලේඛනගත කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | ගිණුම් ශේෂවල වෙනස්කම් සම්බන්ධයෙන් සොයා බලා අදාළ උපලේඛන හෝ මූල්‍ය ප්‍රකාශන නිවැරදි කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 29,540,126 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 31,943,635 ක් ව

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **කුලී** | | |
| ටෙන්ඩර් ක්‍රියාමාර්ග අනුගමනය කර බදු දී ඇති දේපල 06 කින් අයවිය යුතු රු.888,354 ක් අය කරගෙන නොතිබුණි. | රු.598,660 ක හිඟ මුදලක් අයකර ගැනීම නඩු පවරා ඇති බවත් රු.180,815 ක හිඟ පවතින බදු හිමියක් දෙදෙනකු සමථ මණ්ඩලය වෙත යොමු කර මසකට රු.10,000 බැගින් ගෙවීම් කරනු ලබන බවත්, රු.71,829 ක් හිඟව පවතින බදු හිමියන් තිදෙනෙකුගේ හිඟය වසර 10 ඉක්මවා ඇති බැවින් නඩු පැවරිය නොහැකිව පවතින බවත් දන්වා ඇත. | හිඟ ආදායම් අයකළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා අරමුදල් රුපියල් මිලියන 24ක් වැයකර ඉදිකිරීමට අපේක්ෂිත අඹගමුව ආදාහනාගාරයේ ඉදිකිරීම් කටයුතු 2022 අප්‍රේල් 04 දින වනවිට අවසන් කළ යුතුව පැවතුණි. එහෙත් 2022 පෙබරවාරි 22 දින භෞතික පරීක්ෂණ අවස්ථාව වනවිට එහි පාදම යොදා අඩි කීහිපයක් උසට ගඩොල් බිත්ති බැදීම පමණක් සිදුකර තිබුණු අතර ආදාහනාගාරයේ ඉදිකිරීමට පෙර භූමියේ අයිතිය සභාවට පවරාගෙනද නොතිබුණි. | 2022 අගෝස්තු 10 වන විට වහල මට්ටම දක්වා බිත්ති නිමවා ඇති බවත් රු.7,007,415 ක වැඩ නිමවා ඇති බවත් රටෙහි පැවති අයහපත් වාතාවරණයත් සමඟ ව්‍යාපෘතිය නිම කිරීමට 2023 ජනවාරි 08 දින දක්වා කාලය දීර්ඝ කිරීම් ලබාදී ඇති බවත් මේ වනවිට ඉඩම පවරා ගැනීම සඳහා ගරු ඉඩම් අමාත්‍යවරයාගේ අනුමැතිය හිමි වී ඇති බවත් දන්වා ඇත. | කඩිනමින් ඉදිකිරීම් අවසන් කළ යුතු අතර භූමියේ අයිතියද පවරා ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

---

### 4.1 පාරිසරික ගැටලු

---

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ අඹගමුව ප්‍රාදේශීය සභාවේ බල සීමාව තුළ දිරන කසළ ටොන් 502 ක්ද ,නොදිරන කසළ ටොන් 151 ක්ද වශයෙන් කසළ ටොන් 653 ක් ජනනය වී තිබූ අතර සභාව සතුව කසළ කළමනාකරණයට ස්ථානයක් හඳුනාගෙන නොතිබීම හේතුවෙන් එම කසළ මස්කෙලිය ප්‍රාදේශීය සභාවේ රිකාටන් කසල අංගනයට දෛනිකව කිලෝමීටර් 90ක් පමණ දුරක් ගෙවා රැගෙන ගොස් තිබුණි . ඒ සඳහා ටිපර් රථයක්, ගලි රථයක් හා ට්‍රැක්ටර් රථයක් වෙනුවෙන් ඉන්ධන හා අළුත්වැඩියා වියදම රු.1,583,875 ක්ද ,කසල ප්‍රවාහනය සඳහා වූ සෞඛ්‍ය කම්කරුවන් 13 දෙනෙකු හා රියදුරන් දෙදෙනෙකු සඳහා වැටුප් ලෙස රු.16,320,850 ක්ද වශයෙන් රු.17,904,730 ක වියදමක් 2021 ජනවාරි සිට දෙසැම්බර් දක්වා දරා තිබුණි. මෙම කසළ සභා බල ප්‍රදේශය තුළ කළමනාකරණය කරන්නේ නම් මෙම ඉන්ධන වියදම්, අතිකාල වියදම් හා සංයුක්ත දීමනා ආදී වියදම් අවම කරගත හැකිව පැවතුණි. | සභාව සතුව කසළ අංගනයක් නොමැති බැවින් ඒ සඳහා සුදුසු ඉඩමක් හඳුනාගැනීමට කටයුතු කරමින් සිටින බව දන්වා ඇත. එතෙක් මෙම වියදම දැරීමට සිදුවන බවද දන්වා ඇත. | පිරිවැය අවම වන ආකාරයට කසළ කළමනාකරණය කළ යුතුය. |